**ශීර්ෂය 1 - ජනාධිපති කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 1- ජනාධිපති කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 25 දින එම කාර්යාලයේ ජනාධිපති ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

ජනාධිපති කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 3,727.73 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 3,307.04 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 420.69 ක් හෙවත් සියයට 11.29 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2,194.22 | 2,115.99 | 78.23 | 3.57 |
| මූලධන | 1,533.51 | 1,191.05 | 342.46 | 22.33 |
| **එකතුව** | **3,727.73** | **3,307.04** | **420.69** | **11.29** |

## 2.2 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

**ආදායම් ගිණුම**

ජනාධිපති කාර්යාලය විසින් 2015 වර්ෂය සඳහා 10.02.11.00 දරන ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 34,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු මිලියන 33,358 ක ආදායමක් රැස් කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 98.11 ක් වී තිබුණි.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ජනාධිපති කාර්යාලයට අදාළ විෂය අංක 00101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 33.00 | 18.02 | 16.00 | 20.63 | 100 | 62.78 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

ජනාධිපති කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 471.08 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0015/0001/000 | 0.19 |
| 6000/0000/00/0020/0009/000 | 61.67 |
| 6000/0000/00/0002/0113/000 | 1.11 |
| 6000/0000/00/0013/0073/000 | 400.92 |
| 6000/0000/00/0016/0060/000 | 7.10 |
| 6000/0000/00/0018/0072/000 | 0.09 |
| **එකතුව** | **471.08** |

## 2.5 විගණන නිරීක්ෂණය

ජනාධිපති කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 අධි ප්‍රතිපාදන සැලසීම

වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සියයට 23 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වි තිබුණි.

### 3.2 දේශීය මූල්‍යකරණය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් සහ ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මාතර ප්‍රදේශයේ පැවැත්වීමට නියමිතව තිබූ දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඉදිවෙමින් පවතින ගොඩනැගිල්ලේ පළමු අදියරේ වැඩ කටයුතු නිම කිරීමට රු.මිලියන 50 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 අප්‍රේල් 30 දින වන විට ඉන් රු.මිලියන 42.74 ක් වැය කර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ පළමු අදියර ලෙස මහල් දෙකක වැඩ කටයුතු 2015 පෙබරවාරි 27 දින ජනාධිපති කාර්යාලය විසින් නිම කළ යුතුව තිබුණත්, 2016 අප්‍රේල් 30 දින වන විටත් මෙම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු නිම නොකර නවතා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ළමා මිතුරු පාසල් ව්‍යාපෘතිය වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 3.00 ක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 16.42 ක ප්‍රතිපාදන වශයෙන් එකතුව රු.මිලියන 19.42 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2015 ජූලි 02 දිනැති අංක CS/5/Child Friendly Schools/1-vol iv දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය අවසන් වන බව වැඩසටහන් නිලධාරීන් වෙත දන්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කර තිබූ ගොනුවේ ළමා මිතුරු පාසල් ව්‍යාපෘතියට අදාළව නිලධාරීන් පත් කිරීම හා ඔවුන්ට ගෙවීම් කිරීම පමණක් නිරීක්ෂණය වූ අතර ක්‍රියාත්මක වූ වැඩසටහන් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 අවිධිමත් ගනුදෙනු

2015 වර්ෂයේදී විවිධ කාර්යයන් සඳහා රු. 183,000 ක අත්තිකාරම් නිකුත් කර තිබුණත්, එම අත්තිකාරම් කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන එම සම්පූර්ණ අත්තිකාරම් මුදලින්ම පියවා තිබුණි.

### 3.4 කාර්යසාධනය

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාරයසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වි දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2015 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමණාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත සඳහන් පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 61 | 44 | 17 |
| (ii) | තෘතියික මට්ටම | 18 | 16 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 318 | 240 | 78 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 619 | 245 | 374 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්) | 478 | 326 | 152 |
| | **එකතුව** | **1,494** | **871** | **623** |